ඇලහැර ප්‍රාදේශීය සභාව
------------------------------
පොළොන්නරුව දිස්ත්‍රික්කය
-----------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විවිධ තැන්පත් රු. 65,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මඩුදමන හා කෝදුරුවාව ජල ව්‍යාපෘති සඳහා මිලදී ගෙන තිබුණු පිළිවෙලින් රු. 160,000 ක් හා රු. 100,000 ක් වටිනා වතුර මෝටර් දෙකෙහි වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට අතැති තොග වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය සඳහා 2017 දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවිය යුතු රු. 87,078 ක ණය වාරිකය හා ඊට අදාල පොලිය මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ) පුර නැඟුම ව්‍යාපෘතියෙන් සභාව වෙත ලැබී තිබුණු රු. 282,450 ක් වටිනා ආයුධ ආම්පන්න, මෙවලම් හා රු. 75,800 ක් වටිනා ලී බඩු හා සවිකිරීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඉ) බකමූණ ළමා උද්‍යානය සඳහා සභාවේ ආයකත්වය යටතේ මිලදීගෙන තිබුණු හා පුර නැඟුම ව්‍යාපෘතිය මඟින් ලැබුණු ක්‍රීඩා සෙල්ලම් උපකරණවල වටිනාකම පිළිවෙලින් රු. 2,232,400 ක් හා රු. 3,791,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) ඉදි කිරීම් 06 ක් සඳහා වැය කරන ලද රු. 15,010,104 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) දියබෙදුම දෙහිවත්ත කඩ කාමර 08 ක් සඳහා රෝල දොරවල් සවිකිරීම වෙනුවෙන් වැය කර තිබුණ රු. 154,222 ක් සහ කඩ කාමර 08 ක වටිනාකමද, ගණනය කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 217,661 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-------------------------

දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ 2012 වර්ෂයේදී බකමූණ සතිපොළ වහලය ඉදිකිරීම වෙනුවෙන් පුද්ගලික සමාගමක් වෙත ගෙවිය යුතු රු. 2,250,523 ක් ගෙවා නොමැති වීම හේතුවෙන් එම ආයතනය 2017 අගෝස්තු 10 වන දින හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණු බැවින් ඒ මත සිදුවිය හැකි අසම්භව්‍ය බැරකම් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 4 ක ශේෂයන්ගේ වටිනාකම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන වටිනාකම් අතර රු. 874,855 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ලෙජර් ගිණුම් 4 ක ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාල ශේෂයයන් අතර රු. 5,841,595 ක නොසැසඳීම් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් 03 ක දැක්වෙන ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අනුව වූ ශේෂයන් අතර රු. 5,246,208 ක නොසැසඳීමක් පැවතුණි.

(ඈ) දේපල පිරියත උපකරණ ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂ අතර රු. 112,672 ක වෙනසක් පැවතුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

කලින් ලද ආදායම් වශයෙන් වර්ෂ 10 ක පමණ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණු රු. 770,026 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 356,088,543 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකිවිය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 134 (i) වගන්තිය | සභා බල ප්‍රදේශය තුල පිහිටි දියුණු ගම් ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගත යුතුවුවද, සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | සමාලෝචිත වර්ෂය තුලදී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත 30 ක් සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ 371 (2) (ඇ) | අවස්ථා 06 කදී ලබාගෙන තිබූ රු. 70,000 ක අත්තිකාරම් පියවීමට වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. |
| (ii) | මු.රෙ 751 | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු. 394,745 ක් වටිනා විදුලි උපකරණ හා ප්‍රධාන කාර්යාලය සඳහා මිලදී ගෙන තිබූ රු. 87,128 ක් වටිනා පාරිභෝජන ද්‍රව්‍ය තොග ලේඛනවල සටහන් කර නොතිබුණි. |
| (iii) | මු.රෙ 751(i) | ගබඩා භාරකරුගේ ලේඛන හා වාර්තා සටහන් පරීක්ෂා කර නිවැරදි බවට වගකිව යුතු නිලධාරියකු විසින් සහතික කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 756,757 සහ 1647 (අ) | සභාව සතු වාහන 18 ක් සම්බන්ධව වර්ෂ ගණනාවක සිට වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) | 2.11.2 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) | 2.11.3 මාර්ගෝපදේශය | කමිටු රැස්වීම් වල වාර්තා හා තීරණ ඇතුලත් කර සභාව විසින් විධිමත් හා යාවත්කාලීන ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | චක්‍රලේඛ හා ලිපි | |
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගැනීමෙන් තොරව සභාවට අයත් වාහනයක් අලුත්වැඩියාව සඳහා රු. 515,050 ක් වැයකර තිබුණි. |
| (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii) | 2015 දෙසැම්බර් 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ එන්සීපී/එල්පී/එස්/4/12 දරණ ලිපිය | සභාපතිවරයා වෙත වෙන් කර තිබෙන නිල වාහනය 2015 දෙසැම්බර් මස සිට මසකට ලීටර් 150 ක උපරිම ඉන්ධන සීමාවකට යටත්ව ලේකම්වරුන්ට භාවිතා කල හැකි වුවත් |

ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන ලීටර් 3,200 ක් සඳහා රු. 304,000 ක පිරිවැයක් දරා තිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,792,441 ක් වූ අතර , ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 638,061 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,004,277 | 576,184 | 428,293 | 997,306 | 1,036,577 | 753,625 | 610,657 | 849,415 |
| (ii) | කුලී | 467,700 | 1,272,000 | 671,700 | 790,835 | 467,700 | 496,037 | 527,769 | 190,535 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 340,000 | 288,275 | 288,275 | - | 175,000 | 316,310 | 316,310 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,619,800 | 14,348,040 | 14,348,039 | - | 8,638,350 | 9,161,473 | 9,161,473 | - |
| | එකතුව | 15,431,777 | 16,484,499 | 15,736,307 | 1,788,141 | 10,317,627 | 10,727,445 | 10,616,209 | 1,039,950 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ඉකුත් වර්ෂය අවසානයට පැවති රු. 849,415 ක හිඟ වරිපනම් හා බදු ආදායම සහ රු. 190,353 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විට තවදුරටත් පිළිවෙලින් සියයට 16 කින් හා සියයට 315 කින් වර්ධනය වී තිබුණි.

#### 2.2.3 බදුකුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු කඩ කාමර 6 ක් ඒවායේ ගිවිසුම්ගත කුලීකරු විසින් අතුරු බදු දීම මඟින් මාසිකව රු. 111,500 ක් මුදලක් උපයන නමුත් ඒ පිළිබඳව සභාව අවධානය යොමුකර නොතිබුණි.

(ආ) අත්තනකඩවල කඩ කාමර 13 කට අදාලව බිම් කුලී ලැබී නොතිබුණි.

(ඇ) 2018 ජූලි 25 දිනට හිඟ හිටි කඩ කුලී රු. 469,775 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වනවිට වෛද්‍යවරු 15 දෙනෙකු, නීතිඥවරුන් 10 ක් හා මූල්‍ය සමාගම් කිහිපයක් තම ව්‍යාපාරික හා වෘත්තීය කටයුතු සභා බල ප්‍රදේශය තුල සිදු කරමින් තිබුණද අතුරු ව්‍යවස්ථා සම්මත කර එම ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර තිබූ ආයතන කිහිපයකින් පමණක් ගාස්තු අයකර ගෙන තිබූ නමුත් විවිධ ව්‍යාපාර ආයතන වලින් දැන්වීම් පුවරු විශාල ප්‍රමාණයක් ප්‍රදර්ශනය කර තිබූ බව නිරීක්ෂණය විය. ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට කර්මාන්ත 32 ක් පරිසර බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණු නමුත් සුදුසු ආයතන හඳුනාගෙන අදාල බලපත්‍ර ලබාදී නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණු හා බල ප්‍රදේශය තුල වර්ෂ කිහිපයකට පෙර ආරම්භ කර තිබුණු පුද්ගලික නවාතැන්පලකින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂයේ ආදායමෙන් සභාවට ලැබිය යුතු සියයට 1 දක්වා වූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ආයතනයේ වාර්ෂික පිරිවැටුම පිළිබඳ තොරතුරු ද ආයතනය සතුව නොතිබුණි.

(ඈ) සභාවට අයත් JCB යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ දින 11 කදී මිටර් පැය 66.4 ක් සේවයේ යොදවා තිබූ නමුත්, ඒ වෙනුවෙන් අයවිය යුතු රු. 232,400 ක් 2018 ජූනි 08 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 4,250,830 ක් හා මුද්දර ගාස්තු රු. 655,803 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

**--------------------------**

3.1 කාර්ය සාධනය

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටුකිරීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා හඳුනාගෙන නොතිබූ අතර සභාව විසින් අතුරු ව්‍යවස්ථා 04 ක් පමණක් හඳුනාගෙන තිබුණි.

(ආ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යන්

-------------------------------------

ග්‍රාමීය ප්‍රදේශවල මාර්ගවල කි.මී 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 1,260,447 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සභාවේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන නොතිබූ හෙයින් ඒවා මඟින් ඉටුකර ගතයුතු කාර්යයන් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්මක් ද සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති අතර බල ප්‍රදේශයෙන් එකතු වන කැලි කසළ වර්ග කිරීමකින් තොරව බකමූණ දඹුල්ල ප්‍රධාන මාර්ගය අසල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් විවෘත භූමියකට බැහැර කර තිබුණි.

(ii) බල ප්‍රදේශයෙන් වර්ෂ කිහිපයකට පෙර එකතු කර තිබූ කැලි කසළවල අඩංගු වන ප්ලාස්ටික් බෝතල් සහ වෙනත් ප්ලාස්ටික් කැබලි වලින් කොටසක් බෑග් වල බහා ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ ගොඩගසා තිබුණු අතර ප්‍රතිචක්‍රීයකරණය කිරීම හෝ බැහැර කිරීම පිළිබඳ අවධානයක් යොමුකර නොතිබුණි.

(iii) දියබෙදුම සහ අත්තනකඩවල ප්‍රදේශවලින් එකතු වන කැලි කසළ වර්ග කිරීමකින් තොරව මින්නේරිය වනෝද්‍යානයේ අභ්‍යන්තර ප්‍රදේශයකට ගෙන ගොස් දැමීම නිසා වන අලින් එම පොලිතින් ඇතුලු කසල ආහාරයට ගන්නා බැවින් එය වන සතුන්ගේ ජීවිත වලට අවදානමක්ව පැවතුණු බව නිරීක්ෂණය වුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳ කිසිදු දැනුවත්භාවයක් සභාවට නොතිබුණු අතර එම නිසා ඉදිරි සූදානම්වීම සඳහා අවශ්‍ය වූ, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම, ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනා ගැනීම, ඉහත කාර්යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කර ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීම, තිරසර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් (Stake Holders) හඳුනාගැනීම, හඳුනාගත් අරමුණු ඉලක්ක මැනීම සඳහා පාදක දත්ත හඳුනාගැනීම, රැස් කිරීම හා ගබඩා කිරීම යන කිසිදු ක්‍රියාකාරකමක් 2018 මැයි 02 දින වන විටද සිදුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 11 දෙනෙකුගේ රු. 53,383 ක් වූ ඇප තැන්පතු හා ඊට අදාල පොලී නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) පරිසර බලපත්‍රයක් ලබාදීම නුසුදුසු බව ක්ෂේත්‍ර පරීක්ෂක නිලධාරීන් විසින් තීරණය කර තිබූ සිමෙන්ති ගල් නිෂ්පාදන කර්මාන්තයක් වර්ෂ කිහිපයක සිට නිෂ්පාදන කටයුතු සිදු කරගෙන යාම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ඇ) බකමූණ ළමා උද්‍යානය සඳහා සභා දායකත්වය යටතේ මිලදී ගෙන තිබුණ ලද රු. 2,113,650 ක් වටිනා ක්‍රීඩා උපකරණ උපාංග 18 ක් හා පුර නැගුම ව්‍යාපෘතිය මඟින් ලැබී තිබුණ රු. 3,791,000 ක් වටිනා ක්‍රීඩා උපකරණ 9 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයක ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු අනුව ද්විතික මට්ටමේ තනතුරු 04 ක අතිරික්තයක් හා තනතුරු 08 ක් පුරප්පාඩු පැවති අතර, ප්‍රාථමික මට්ටමේ තනතුරු 11 ක අතිරික්තයක් හා තනතුරු 04 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) කාර්ය මණ්ඩල විස්තර අනුව රියදුරු තනතුරු 04 ක් අනුමත කර තිබුණද, සේවයේ නිරත ස්ථිර රියදුරන් තිදෙනාට අමතරව අනියම් සේවකයින් 06 දෙනෙකු රියදුරන් වශයෙන් අනුමැතියකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(ඇ) ද්විතික මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු 04 ක්, කළමනාකරණ සහකාර තනතුරු 02 ක්, කාර්මික නිලධාරී තනතුරු 01 ක් හා පුස්තකාලාධිපති තනතුරු 01 ක් ද පුරප්පාඩු වී පැවතුණි.

(ඈ) ප්‍රාථමික මට්ටමේ මාර්ග කම්කරුවන් 04 ක්, සෞඛ්‍ය කම්කරුවන් 03 ක්, ජල හා මුරකරුවන් 02 ක් අනුමත කාර්ය මණ්ඩලයට පිටතින් බඳවාගෙනසේවයේයොදවාතිබුණි.

(ඉ) සහකාර ගිණුම් නිලධාරී තනතුරු 01 ක් හා තාක්ෂණික සහායක තනතුර 01 ක් සඳහා පුද්ගලයින් දෙදෙනෙකුද වර්ෂ 02 කට අධික කාලයක සිට බඳවාගෙන සේවයේ යොදවා තිබුණද එම තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් දෙහිවත්ත ඉඩමේ කඩ කාමර ඉදිකර ගැනීම සඳහා ටෙන්ඩර් කරුවන් 9 දෙනෙකු විසින් රු. 1,065,000 ක් ගෙවා තිබුණද 2018 අප්‍රේල් 30 දින වන විටත් බිම් කොටස් ලබාදී නොතිබුණි.

(ආ) දෙහිවත්ත කඩ කාමර 16 ක් 2012 වර්ෂයේදී රු. 13,004,000 කට ටෙන්ඩර් කර තිබුණද එම මුදලින් රු. 4,595,250 ක් හිඟව පැවතුණි. මෙම කඩ කාමර 16 සඳහා විදුලිය ලබාදී බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂ 05 ක පමණ කාලයක සිට කුලී වශයෙන් සභාවට රැස්කරගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

--------------------------

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

----------------------------------------

2017 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර තිබූ නමුත් 2018 ජුනි 08 දින වන විටත් අදාල වාර්තාව ඉදිරිපත් කිරිමට කටුතු කර නොතිබුණි.

(ආ) නිෂ්ක්‍රීය වත්කම්

-------------------

(i) සභාව සතු සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයට අදාල රු. 522,500 ක් වටිනා උපකරණ කට්ටලය වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

(ii) අබලන් වී ඇති කැබ් රථය වර්ෂ 10 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවති අතර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 හඳුනාගත් පාඩු

-------------------

2016 වර්ෂයේදී ජල බවුසරය කුලියටදීම වෙනුවෙන් පුද්ගලික ආයතනයකින් ලැබිය යුතු රු. 156,000 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී සභාව කටයුතු කර නොතිබුණි.

3.7 ප්‍රසම්පාදනය

---------------

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------------

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) දූර ගමන් බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

----------------------------------------------------------------------------------

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර යෝජිත භූමියේ කළු ගල කඩා ඉවත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට භූමියේ පිහිටි කළුගල කැඩීම සඳහා රු. 13,163,228 ක් වැයකර තිබුණු නමුත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් දූරගමන් බස් නතර කිරීම සඳහා ඇලහැර විවිධසේවා සමූපකාර සමිතියට අයත් භූමියක් තෝරාගෙන රු. මිලියන 50 ක් වැයකර බස් නැවතුම්පළක් ඉදි කිරීමට තීරණය කර තිබුණු බැවින් මේ සඳහා වැය වූ සියළුම මුදල් නිශ්කාර්ය වී තිබුණි. තවද වෙඩි බෙහෙත් ලබාගැනීමට ලබා දී තිබෙන රු. 595,000 ක අත්තිකාරම් මුදලින් රු. 225,000 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

**04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 03 වන දිනදී ය.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සිපී/සීඑස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා තිබුණ 2017 වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

4.4 අයවැය පාලනය

-------------------

සභාවේ ආදායම් විෂයයන් 3 ක තථ්‍ය ආදායම හා ඇස්තමේන්තුගත ආදායම අතර සියයට 27 සිට සියයට 65දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූ අතර වියදම් විෂයයන් 4ක සියයට 30 සිට සියයට 1, 107 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වුණි

**05.** **පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය .

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | -------------------- | | ---------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | සියලුම ස්ථාවර වත්කම් ලේඛන ගතකරවත්කම් ලේඛන යාවත්කාලීනව නොපැවත්වීම |
| | | (ii) | සභාව භාවිතා කරන සියලුම වත්කම්වලඅයිතිය පවරා නොගැනීම |
| (ආ) | ගිණුම්කරණය | (i) | පොත්පත් ලේඛන හා වාර්තා යාවත්කාලීනව නොපැවැත්වීම |
| | | (ii) | මුදල් රැස්කිරිම හා ගිණුම්ගත කිරිම යාවත්කාලීනව සිදු නොවීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අය නොකිරීම |
| | | (ii) | බදු ගිවිසුම් විධිමත් නොකිරීම |
| | | (iii) | අභ්‍යන්තර පරීක්ෂාවක් සිදු නොවීම |
| (ඈ) | ණයගැති /ණයහිමි පාලනය | (i) | නිවැරදි ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | ණයගැතියන් හා ණයහිමියන් නිරවුල් නොකිරීම |
| | | (iii) | ණයගැති හා ණය හිමි කාල විශ්ලේෂණයක් සකස් කර ඉදිරිපත් නොකිරීම |
| (ඉ) | වාහන පාලනය | (i) | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂා නොකිරීම |
| | | (ii) | වාහන පිළිබඳ සමීක්ෂණයක් නොපැවැත්වීම |
| | | (iii) | වාහන සම්බන්ධව විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර නොතිබීම. |